යටි සිතින් මම ආදරය සොයමි

රුවනි දුනුවිල ගේ සීඩී තැටිය නිකුත් වෙයි

රුවනි දුනුවිල ගේ යටි සිතින් මම ආදරය සොයමි සංගත තැටිය තරංගා ලේබලයෙන් පසුගිය දා නිකුත් විය.

මහනුවර උසස් බාලිකා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ රුවනි පාසල් අවදියේදීම සංගීත ක්ෂෙත්‍රයට අවතීර්ණ වූවා ය. ස්ටැන්ලි පීරිස් හා ටෝනි හසන් සමග ඇගේ මුල්ම ගීත කැසට් පටය නිකුත් කරන විට ඇගේ වයස අවුරුදු දාහතක් විය. පාසල් අධ්‍යාපනයෙන් පසුව ක්වීන්ස් හා ටාජ් ආයනයන්හි පිළිගැනීමේ නිළධාරිනියක ලෙස සේවය කළ ඇය 1984 දී පමණ ස්වාධීන රූපවාහියේ නිවේදිකාවක ලෙසද කටයුතු කළා ය. එතැන් පටන් ටෙලි නාට්‍ය ක්ෂෙත්‍රයට සම්බන්ධ වූ රුවනි සුබ ප්‍රාර්ථනා, අඹ යාළුවෝ, ධර්මාධිකරණය, වල අවල සහ විලම්බීත යන ටෙලි නාට්‍ය වලට රංගනයෙන් දායක වූවා ය. වර්ල්ඩ් විෂන් ආයතනය වෙනුවෙන් නිපැයුණ සුබ ප්‍රාර්ථනා හි හෙදියකගේ චරිතය හා අඹ යාළුවෝ ටෙලි නාට්‍යයේ මල් පිපේ ද නෙත් ඇරේ ගීතය ගයමින් සංගීත ගුරුවරියක ලෙස කළ රංගනයත් බෙහෙවින් ජනප්‍රිය විය.

රුවනි ලංකාවේ සුප්‍රකට ගායකයන් වන ග්‍රේෂන් ආනන්ද, කීර්ති පැස්කුවල් හා නිමල් ජයමාන්න ආදීන් සමග යුග ගායනා ඉදිරිපත් කර ඇත. ඈ ගී ගැයූ සන්තෝෂවන්න නන් ස්ටොප් ගීත කැසටය ද ජනප්‍රිය විය.

1995 දී ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ ඇයගේ මුල්ම සංයුක්ත තැටිය යම් සිතින් මම ආදරය සොයමි වෙයි. එය කළ එළි බසින්නේ තරංගා නිෂ්පාදයක් ලෙසය.

මියුරු ගී සොළොසකින් සමන්විත මේ සීඩී තැටියට ලංකාවේ ප්‍රසිද්ධ සංගීතඥයන් වන ජගත් වික්‍රමසිංහ, උපාලි කන්නන්ගර, ස්ටැන්ලි පීරිස් හා කීර්ති පැස්කුවල් ආදීන්ගේ දායකත්වය ලැබී ඇත. හේමසිරි හල්පිට, චන්ද්‍රදාස ප්‍රනාන්දු ඇතුලු ජනප්‍රිය ගීත රචකයන් රැසකගේ ගී පද රචනා රුවනි මේ තැටියට ගායනා කර ඇත.

රුවනි දුනුවිලගේ ඉදිරි ගමනට අපි සුබ පතමු.

ජගත් වෙත්තසිංහ

සංහිඳ පාමුල සිට

දිවුල් සමග සංවාදයක්

මහින්ද දිසානායක [illegible]

රසික දන කුල්මත් කළ සාර්ථක ඔස්ට්‍රේලියානු සංචාරයකින් පසුව අගෝස්තු 9 වන දා ලංකාවට යාමට දින කීපයකට පෙරදී නිවසේ ආලින්දයේ විවේකීව සිටින විටකදී කරුණාරත්න දිවුගනේ ගායන ශිල්පියාත් මමත් පොඩි දවස් වල ගමේ කතා බහකින් ම සංවාදය ආරම්භ කළෙමු. ඔහුටත් මටත් එය සුන්දර වූ සිහිනයක මතක සටහනක් විය.

ඔබ හිතනවද අපි විඳපු නිදහස දැන් ගම් වල ළමයින්ට නෑ කියලා

ඇත්තටම දැන් නම් ගම අපේ කාලෙට වඩා ගොඩක් වෙනස් වෙලා. පරිසරයත් වෙනස්. අපට වගේ නිදහසක් නැහැ.. ඒ කාලේ මතකද ඉස්කෝලේ ඇරිලා ආව ගමන් අපි වැවට පනිනවා. එගොඩට මෙගොඩට කොච්චර පීනලා ඇද්ද..? ඇයි වැවේ ඔට්ටු සෙල්ලම්. අපි දිවුල් දං අහුලන්න කන්දට ගිය හැටි. මට නම් තාම ඒ සිද්ධි හොඳටම මතකයි. ඒත් අපි ඉගෙනත් ගත්තා. නිදහසත් බුක්ති වින්දා..

රජරට ගුවන් විදුලි සේවයේ නිවේදකයෙකු ලෙස වැඩ ආරම්බ කළත් ඔබ ගායන ශිල්පියෙක් වුණා..

ඔව්.. ඔබටත් මතක ඇති.. මම හිතන්නේ ගායනයට හා වාදනයට මගේ පුංචි කාලේ ඉඳලම තිබුණ ආශාව හා හැකියාව මා එතනට ගෙන ආවා.. ඒ විතරක් නෙවෙයි.. ඒ කාලේ ගුවන් විදුලියේ සේවය කළ විශාරද ගුණදාස කපුගේ, ස්වර්ණා ශ්‍රී බන්ඩාර, විජයනන්ද ජයවීර ආදී කලාකරුවන් මගේ ඉදිරි ගමන සඳහා දායක උනා. විශේෂයෙන් සඳහන් කළොත් විශාරද ගුණදාස කපුගේ සිහිපත් කල යුතුවම තිබෙනවා. මගේ මුල් කැසට් පටය ඇසට අසුවන මායිමේ එළි දැක්වුණේ අපි දෙන්නා අග නගරයට ආවට පස්සෙ. ඉන් පස්සෙ තමයි රසික ජනතාව මාව අඳුනාගත්තෙ.

වෙනත් රටවල සජචාරය කර තිබුණත් එබ ඔස්ට්‍රේලියාවෙට මුලින්ම ආවේ නිල් දියවර ප්‍රසංගයට

මම හුඟාක්ම සතුටට පත්වුණ ප්‍රසංගයක් උනා නිල් දියවර. ඔස්ට්‍රේලියාවේදී මගේ ප5සංගය බලන්න ප්‍රදර්ශණවාර දේකේදීම අතුරු සිදුරු නැතිව රසිකයන් පිරුණා. දැනට අවුරුදු තුනකට පෙරදිත් මගේ සහෘද රසික ජනතාව මාවත් මගේ ගීතත් ආදරයෙන් රස වින්දා.

මෙවර සංහිඳ පාමුළ ගැන මොකද හිතන්නෙ

ඇත්තෙන්ම මම මෙවර ගොඩාක්ම සතුටට පත්වුණා. සංහිඳ පාමුල සංගීත ප්‍රසාංගය මෙල්බන් නගරයේ පමණක් නොව සිඩ්නි හා බ්‍රිස්බන් ආදී නගර වලදීත් සාර්ථකව පැවැත්වුණා.. රසික ජනතාව මගේ ගීත ඇසීමෙන් ආනන්දයට පත් උනා. ගායකයෙක් කලාකරුවෙක් විදිහට මගේ එකම අභිලාශයත් මගේ රසිකයන් හොඳ උසස් නිර්මාණයන්ගෙන් සතුටට පත් කිරීමයි. මේ නගර තුනේදිම ඔවුන්ගේ හොඳ ප්‍රතිචාරයෙන් මම එය තේරුම් ගත්තා. සීතල, වැස් පවා නොතකා විශාල රසික පිරිසක් සහභාගි වුණා. උසස් නිර්මාණ අගය කරන ශ්‍රාවකයන් විශාල පිරිසක් සිටීම මම අගය කරනවා.

ශ්‍රී ලංකාවේ ප්‍රසංග වේදිකාවේ, ගුවන් විදුලියේ හා රූපවාහිණියේ ඔබ ජනප්‍රිය ගායන ශිල්පියෙක්

මටම ආවේනික කටහඬත් මගේ උසස් නිර්මාණත් ඒකට හේතුවක්. මම විශාල ගීත ප්‍රමාණයක් නිකුත් කරලා නැතත් මා ගායනා කළ හැම ගීතයක්ම එකසේ ජනප්‍රියත්වයේ පවතිනවා. මගේ ගීත සඳහා පද රචනා කර තිබෙන්නේ උසස් නිර්මාණ කරුවන්. ඔවුන් සිංහල සාහිත්‍යය, භාෂාව හා අපේ සංස්කෘතික උරුමයන් පිලිබඳව හොඳ දැනුමක් ඇති අය. ඒ වගේම මම තෝරාගන්නා නිර්මාණ හොඳ උසස් නිර්මාණ වීම. පළමුවෙන්ම ගායකයෙක් හොඳ රසිකයෙක් වෙන් ඕනෑ. එතකොටයි ඔහුට හොඳ ගීත පද රචනාවක් උනත් තෝරා ගන්න හැකියාවක් ලැබෙන්නෙ. හොඳ නිර්මාණයකින් සමාජයට දිය යුතු පණිවිඩයක් තියෙනවා. යහපත් සමාජයක් සඳහා එය පිටිවහලක් වෙනවා. ඒත් කලාකරුවෙක් කියන්නේ සමාජ ශෝධකයෙක් නම් නෙවෙයි. ඔහු පෙරමග ගමන් කරුවෙක් විය යුතුයි.

වැඩි වශයෙන් ඔබේ ගීත වල ගැමි සුවඳත් ආදරයත් ගැබ් වෙලා තිබීම විශේෂයක්. ඒ ගැන ඔබේ අදහස.

ඒක ඇත්ත. අපි ගමේ ඉපදිලා ගැමිකම අපේ ජීවිත වලට කාවැදිලා තියෙන්නෙ.අපේ තාත්තලා අම්මලත් හොඳ ගොවියෝ. අපි පුංචි කාලෙත් මේ වෙල් ඉපනැලි වල වැව් වල ඇවිද්දා. අපිට සෞන්දර්යය ගැන කියා දුන්නේ අපේ ගම.

20 පිටට


ඉතිහාසයේ තීරණාත්මක මං සන්ධියකට අපි පැමිණ සිටින්නෙමු. යුගයේ අවශ්‍යතාව ජාතියේ අවශ්‍යතාව වෙනුවෙන් ඔබේ යුග මෙහෙවර උදෙසා

සැප්තැම්බර් 11 වෙනි ඉරිදා පෙරවරු 11 ට මෙල්බර්න් නුවර පාර්ලිමේන්තුව අභියස

ජනතා විමුක්ති පෙරමුණේ ජාත්‍යන්තර අංශයද , දේශප්‍රේමී ශ්‍රී ලාංකික සංවිධාන ගණනාවකගේම සහභාගීත්වයෙන්, දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානයේ කුරිරු ත්‍රස්තවාදය පරාජය කිරීමට ජාත්‍යන්තර ජනමතයක් ගොඩනැගීම සඳහා පැවැත්වීමට යන විරෝධතා රැළිය සාර්ථක කරගැනීමට දේශප්‍රේමී ශ්‍රී ලාංකික ඔබ සැමට මෙයින් ආරාධනා කර සිටිමු.

විශ්වාසයෙන් යුතුව පෙරමුණ ගන්න. ජයග්‍රහණය රටටයි - අනාගතය ඔබටයි

වැඩි විස්තර සඳහා අමතන්න,
[illegible] 0418 104 685, අනුර [illegible] 0403 481 807, [illegible] 0433 388 341

ආතතිය 15 වන පිටෙන්

14 සමහර අවස්ථා මඟ හැරීමට වඩා කැමතිය ☐
15 යමකට සිත යොමු කිරීම, මතක තබා ගැනීම හෝ තීරණගැනීමට මට අපහසුය ☐
16 සමහර දුක්බර සිතිවිලි වලින් මට අත්මිදිය නොහැක ☐
17 ලිංගික කාර්යයන් සඳහා කැමැත්තක් නොදක්වමි ☐
18 උදරයේ හෝ පපුවේ නොසන්සුන් බවක් දැනේ ☐
19 මා ගැන මා තුළ විශ්වාසයක් නැත ☐
20 මා හට යම් තත්වයනට මුහුණ දීමට නොහැකි යයි සිතේ ☐
21 හිසරදයෙන් පෙළෙමි ☐
22 ජීවිතයේ වටිනාකමක් නැතැයි සිතෙයි ☐
23 අනාගතය පිළිබඳව මා තුළ ඇත්තේ අසුභවාදී සිතිවිලිය ☐
24 මා දැඩි ලෙස පීඩනයට පත් ්ඇති බවක් දැනේ ☐
25 පිරිසිදු බව ගැන අසාමාන්‍ය ලෙස සැළකිලිමත් වෙමි ☐
26 කැක්කුම් සහ වේදනාවන්ගෙන් පෙළෙමි ☐
27 මට පහසුවෙන් හැඬිය හැකිය ☐
28 ශාරීරිකව දුබල බවක් දැනේ ☐
29 කැකිල්ල, ක්ලාන්ත ගතිය වැනි තත්වයක් දැනේ ☐
30 මා මිතුරන් ප්‍රිය නොකරන අතර විනෝදාංශ පිළිබඳවද ආශාවක් නැත ☐

එකතුව ☐

ඔබට ආතතිය තිබේද?
ඔබ ආතතියෙන් පීඩා විඳින්නේද යන්න දැන් තීරණය කරන්න.

එකතුව 40 ට වැඩි ඔබ දැඩි ලෙස ආතතියෙන් පෙළෙන්නෙකි. ඉන් මිදීමට වහා පියවර ගන්න
එකතුව 20 - 40 අතර - ඔබ සාමාන්‍ය මට්ටමේ ආතති තත්වයකින් පෙළෙයි. ඊට මුහණ දීමට ඔබේ කුසලතා දියුණු කරගන්න
එකතුව 20 ට අඩු - ඔබට ගැටළුවක් නැත